සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

## නර්තනය (දේශීය) I

කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

01. අද්‍යතන වන්නම් අතරින් ප්‍රේමකුමාර එපිටවෙල මහතා විසින් සාර්ථක රංග වින්‍යාසයකින් යුතුව ඉදිරිපත් කරන ලද්දේ,
    1. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි රචනා කළ මරඟන වන්නමයි.
    2. අරිසෙන් අහුබුදු විසින් රචනා කළ හංස වන්නමයි.
    3. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ විසින් රචනා කළ මහබෝ වන්නමයි.
    4. ආරියරත්න කළුආරච්චි විසින් රචනා කළ ඇගලුම් වන්නමයි.
    5. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි රචනා කළ යශෝධරා වන්නමයි. (........)

02. ද්‍රවිඩ ජනතාව හා බැඳුණු ජන නර්තන අතර ඉතා පැරණිම ගැමි නැටුම් විශේෂයක් හා වැසි ලබා ගැනිමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ ගැමි නැටුමක් වන්නේ,
    1. කෝලාට්ටම් හා කුම්මි ය.
    2. කරනාට්ටම් හා චෙම්බු ය.
    3. කෝලාට්ටම් හා චෙම්බු ය.
    4. කරනාට්ටම් හා කුම්මි ය.
    5. කරගම් හා කුම්මි ය. (........)

03. ඌරා යක්කම, නානුමුරය, පොත්කඩේ යක්කම යන නාට්‍යමය පෙළපාලි අයත් ශාන්ති කර්ම වන්නේ,
    1. කොහොඹා කංකාරිය, රට යකුම, පහන් මඩුව
    2. කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, කිරි මඩුව
    3. කොහොඹා කංකාරිය, සන්නියකුම, පහන් මඩුව
    4. වළියක් මංගල්‍යය, රට යකුම, පහන් මඩුව
    5. කොහොඹ කංකාරිය, රට යකුම, කිරි මඩුව (........)

04. බලි ශාන්ති කර්මයේ දී යම, වායු, කාල්, මූර්තු පිළිබඳ විස්තර කෙරෙනුයේ,
 1. ඇඹුම් කවි වලිනි 2. සිරස පාද කවි වලිනි 3. ග්‍රහ පන්ති කවි වලිනි
 4. කඩතුරා කවි වලිනි 5. හිං හතරේ කවි වලිනි (........)

05. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ දෝෂ විපත් දුරුකිරීම සඳහා කොහොඹා කංකාරි ශාන්ති කර්මය පැවැත්වූ බව සඳහන් වනුයේ,
 1. කෝට්ටේ යුගයේ රචිත කුවේණි අස්නෙහි ය. 2. මහනුවර යුගයේ රචිත කුවේණි අස්නෙහි ය.
 3. කෝට්ටේ යුගයේ රචිත සිහබා අස්නෙහි ය. 4. මහනුවර යුගයේ රචිත සිහබා අස්නෙහි ය.
 5. කුරුණෑගල යුගයේ රචිත දඹදෙණි අස්නෙහි ය. (........)

06. ''වළියක් මංගල්‍යය විමසුම'' හා ''සිංහල සැරසිලි කලාව'' යන ග්‍රන්ථ රචනා කළ ශිල්පීන් වන්නේ,
 1. ජේ.ඊ. සේදරමන් හා ජයසේන කෝට්ටගොඩ ය.
 2. මුදියන්සේ දිසානායක හා සී.ද.එස්. කුලතිලක ය.
 3. ලයනල් බෙන්තරගේ හා සරත් විජේවර්ධන ය.
 4. මුදියන්සේ දිසානායක හා ලයනල් බෙන්තරගේ ය.
 5. ජේ.ඊ. සේදරමන් හා තිස්ස කාරියවසම් ය. (........)

07. ''ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන් මෙහි,
 1. ලඝු මාත්‍රා 8ක් සහ ගුරු මාත්‍රා 05 කි. 2. ලඝු මාත්‍රා 7ක් සහ ගුරු මාත්‍රා 06 කි.
 3. ලඝු මාත්‍රා 6ක් සහ ගුරු මාත්‍රා 04 කි. 4. ලඝු මාත්‍රා 7ක් සහ ගුරු මාත්‍රා 05 කි.
 5. ලඝු මාත්‍රා 8ක් සහ ගුරු මාත්‍රා 04 කි. (........)

08. මංගර හැල්ල, නුගේ හැල්ල ...... යන සුවිශේෂී ගායනා දැකිය හැක්කේ,
 1. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ ය. 2. පහන් මඩුව ශාන්ති කර්මයේ ය.
 3. දෙවොල් මඩුව ශාන්ති කර්මයේ ය. 4. කිරිමඩුව ශාන්ති කර්මයේ ය.
 5. රට යකුම ශාන්ති කර්මයේ ය. (........)

09. ''කවියෙන් කීවත් මුණි ගුණ වරුණා....'' මෙම කවිය,
 1. පන්තේරු කවියකි. 2. සූවිසි විවරණ කවියකි.
 3. කඩතුරා කවියකි. 4. වරම් කවියකි.
 5. උඩැක්කි කවියකි. (........)

10. පිළිවෙලින් මාත්‍රා $4 + 4$ තාලයට හා මාත්‍රා $3 + 4$ තාලයට නර්තනය කළ හැකි වන්නම් වනුයේ,
 1. ගජගා, මුසලඩි, සුරපති, උදාර වන්නම් ය. 2. උකුසා, මයුරා, සුරපති, කිරලා වන්නම් ය.
 3. ගජගා, උකුසා, මුසලඩි, සුරපති වන්නම් ය. 4. ගජගා, මයුරා, කිරලා, උදාර වන්නම් ය.
 5. උකුසා, මයුරා, සුරපති, මුසලඩි වන්නම් ය. (........)

11. මණ්ඩම හා හඬබෑය සම්බන්ධ කරන වරපටි ගෙතුම හඳුන්වනු ලබන්නේ,
 1. වලයම ලෙස ය. 2. කොට්ට බිස්ස ලෙස ය. 3. කුන්දිරම් පල්ල ලෙස ය.
 4. ගැටිවැල ලෙස ය. 5. සුරත් තට්ටුව ලෙස ය. (........)

12. සොළොස් මගල නම් වූ සැරසිල්ල විශේෂයෙන් දක්නට ලැබෙන්නේ,

1. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ ය.
2. කිරි මඩුව ශාන්ති කර්මයේ ය.
3. වලියක් මංගල්‍යය ශාන්ති කර්මයේ ය.
4. රට යකුම ශාන්ති කර්මයේ ය.
5. සන්නියකුම ශාන්ති කර්මයේ ය. (........)

13. ''අග්නි දිගට අධිපතිවම කිවිදෙවි මන නන්දා'' යන කවියෙන් කියැවෙන්නේ,

1. සිකුරු ග්‍රහයා පිළිබඳව ය.
2. අඟහරු ග්‍රහයා පිළිබඳව ය.
3. බුධ ග්‍රහයා පිළිබඳව ය.
4. රවි ග්‍රහයා පිළිබඳව ය.
5. සඳු ග්‍රහයා පිළිබඳව ය. (........)

14. දේශීය නර්තන ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී මහාවංශයේ ලියන ලද ටීකාවක් වූ ''වංසත්ථප්පකාසිනිය'' හා ''කඳවුරු සිරිත'' යන මූලාශ්‍ර අයත් වන්නේ,

1. අනුරාධපුර හා යාපහුව යුගයන්ට ය.
2. පොළොන්නරුව හා කුරුණෑගල යුගයන්ට ය.
3. පොළොන්නරුව හා දඹදෙණි යුගයන්ට ය.
4. අනුරාධපුර හා කුරුණෑගල යුගයන්ට ය.
5. අනුරාධපුර හා දඹදෙණි යුගයන්ට ය. (........)

15. ''දුන් සුමන විවරන - කන්ද සුරිඳුගෙ බලයෙන්'' මෙම කෙටි කවිය ගයමින් සභාවට පිවිසෙන චරිතය වනුයේ,

1. කළු යකා ය.
2. අභිමාන යකා ය.
3. රීරි යකා ය.
4. මහසොහොන් යකා ය.
5. ගරා යකා ය. (........)

16. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ මඩුපුරය හා පහන් මඩුව ශාන්ති කර්මයේ මල් මඩුපුරය නර්තන අංග වලදී සුවිශේෂීව පුද ලබන දෙවිවරුන් වන්නේ,

1. වීර මුණ්ඩ හා පත්තිනි දෙවිවරුන් ය.
2. කතරගම හා වීරමුණ්ඩ දෙවිවරුන් ය.
3. සමන් හා පත්තිනි දෙවිවරුන් ය.
4. වීරමුණ්ඩ හා දැඩිමුණ්ඩ දෙවිවරුන් ය.
5. නාථ හා විෂ්ණු දෙවිවරුන් ය. (........)

17. දෙකොන විලක්කු නැටීම, සූනියම් වීදිය නැටීම, වාහල නැටීම යන නර්තන අංග ඇතුළත් වනුයේ,

1. බලි ශාන්ති කර්මයේ ය.
2. රට යකුම ශාන්ති කර්මයේ ය.
3. කිරි මඩුව ශාන්ති කර්මයේ ය.
4. දෙවොල් මඩුව ශාන්ති කර්මයේ ය.
5. සන්නියකුම ශාන්ති කර්මයේ ය. (........)

18. පාරම්පරික සම්මත ක්‍රම අනුව වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේදී ''හඬ ඉර'' සහ නියඳ කෙඳි භාවිතා කර ඇත්තේ,

1. ගැටබෙරය හා දවුල වාදන භාණ්ඩ සඳහා ය.
2. උඩැක්කිය හා දවුල වාදන භාණ්ඩ සඳහා ය.
3. දෙවොල් බෙරය හා දවුල් බෙරය සඳහා ය.
4. උඩැක්කිය හා ගැටබෙරය වාදන භාණ්ඩ සඳහා ය.
5. ගැටබෙරය හා උඩැක්කිය වාදන භාණ්ඩ සඳහා ය. (........)

19. නටුවාංගම් තාල වාද්‍ය භාණ්ඩය හා උප්පනයි වේෂ නිරූපණ ක්‍රමය භාවිතා කරනු ලබන්නේ.
   1. උත්තර භාරතීය මනිපුරි නර්තන සම්ප්‍රදායේ ය.
   2. දක්ෂිණ භාරතීය භරත නර්තන සම්ප්‍රදායේ ය.
   3. උත්තර භාරතීය කථක් නර්තන සම්ප්‍රදායේ ය.
   4. දක්ෂිණ භාරතීය කථකලි නර්තන සම්ප්‍රදායේ ය.
   5. දක්ෂිණ භාරතීය කථක් නර්තන සම්ප්‍රදායේ ය. (........)

20. කථක් නර්තන ශිල්පියාගේ කනට හා දෙපයට පළඳින ආභරණ වනුයේ,
   1. ජිමික්කි හා සලංගෙයි ය.
   2. ලෙහෙගා හා ගුංගුරු ය.
   3. කරණ්ෆුල් හා නූපූර් ය.
   4. කාන්කන් හා ගුංගුරු ය.
   5. සලංගෙයි හා ගෙජ්ජිය. (........)

21. දේශීය තාල පද්ධතියෙහි මාත්‍රා 4 + 4 ගති ලක්ෂණයට සමානවන කර්ණාටක තාල පද්ධතිය වනුයේ,
   1. ඛණ්ඩ ජාති ඒක තාල
   2. මිශ්‍ර ජාති ඒක තාල
   3. සංකීර්ණ ජති ඒක තාල
   4. චතුශ්‍ර ජාති ඒක තාල
   5. ත්‍රිශ්‍ර ජාති ඒක තාල (........)

22. රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්පය වන චලනයේ ස්වභාවය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,
   1. කාලය, වේගය, දිසා හා දුර ය.
   2. දිසා, තල, වේගය හා දුර ය.
   3. කාලය, වේගය, දුර හා සම්බන්ධතා ය.
   4. අවකාශය, ශක්තිය, වේගය හා හැඩතල ය.
   5. ශක්තිය, කාලය, වේගය හා දුර ය. (........)

23. ''වෙරි වත්ත'' හා ''කැලෑ මල්'' අයත් නාට්‍යය ශෛලීන් වනුයේ,
   1. තාත්වික නාට්‍යය හා ගීත නාට්‍යය ය.
   2. තාත්වික නාට්‍යය හා ශෛලිගත නාට්‍යය ය.
   3. ගීත නාට්‍යය හා මුද්‍රා නාට්‍යය ය.
   4. ශෛලිගත නාට්‍යය හා ගීත නාට්‍යය ය.
   5. තාත්වික නාට්‍යය හා මුද්‍රා නාට්‍යය ය. (........)

24. දේශීය තාල පද්ධතියේ මහ තනි තිතට සමාන හින්දුස්ථානි තාල පද්ධතියේ කෙහෙර්වා තාලය වන්නේ,
   1. ධා ධිං ධිං ධා, ධා ධිං ධිං ධා, ධා තිං තිං තා, තා ධිං ධිං ධාය
   2. ධා ධිං ධා ධා ධිං, තා තිං ධා ධා යං ය
   3. ධා ගෙ න ති, න ක ධි න ය
   4. ධී න ධි ධි නා, තී න ධි ධි න ය
   5. ධා ධී නා, ධා තු නා ය (........)

25. බැරිසිල් හා පටාචාර මුද්‍ර නාට්‍යය අධ්‍යක්ෂණය කරන ලද්දේ,
   1. ප්‍රේම කුමාර එපිටවෙල මහතා සහ මිරැන්ඩා හේමලතා මහත්මිය විසිනි.
   2. චිත්‍රසේන මහතා සහ වජිරා චිත්‍රසේන මහත්මිය විසිනි.
   3. වසන්ත කුමාර මහතා සහ ශේෂා පලිහක්කාර මහතා විසිනි.
   4. වසන්ත කුමාර මහතා සහ ආරියරත්න කළු ආරච්චි මහතා විසිනි.
   5. ආරියරත්න කළු ආරච්චි මහතා හා ජානකී හීල් මහත්මිය විසිනි. (........)

- **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. රට යකුම ශාන්ති කර්මයේ .................................................. දොළහ පෙළපාලියට අයත් රංග භාණ්ඩ බහාලීම සඳහා යොදා ගනී.
27. කෝට්ටේ IV වන පරාක්‍රමබාහු රජු වෙනුවෙන් .................................................. නම් ප්‍රශස්ති කාව්‍යය රචනා වී ඇත.
28. කොහොඹා කංකාරිය ශාන්ති කර්මයේ සීතා බිසවගේ දරුවන් තිදෙනා .................................................. නමින් හඳුන්වන බව අංකෙළි උපත සාහිත්‍යයේ සඳහන් වේ.
29. මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතා විසින් පහතරට සම්ප්‍රදායේ නවතම වන්නමක් ලෙස .................................................. නිර්මාණය කර ඇත.
30. කිරිමඩුව ශාන්ති කර්මයේ දී ඇත් බන්ධනය සහ මී බන්ධනය අවස්ථාවලදී ඇතා හා මීමා නිරූපණය කිරීම .................................................. විසින් සිදු කරයි.
31. භරත නාට්‍ය සංදර්ශනයක ඉතාම දීර්ඝවූත්, අසීරුවූත් නර්තන අංගයක් වනුයේ .................................................. ය.
32. වාද්‍ය භාණ්ඩ උපකරණ සෑදීමේ දී කිරිඳි වැල්, කුකුල වැල් .................................................. සෑදීම සඳහා භාවිතා කරයි.
33. ශ්‍රී ලංකාවේ මුද්‍ර නාට්‍ය කලාවේ වේදිකා පසුතල නිර්මාණකරණයේ දැවැන්ත චරිතයක් ලෙස .................................................. හැඳින්විය හැකි ය.
34. උඩැක්කි ඇසෙහි විෂ්කම්භය .................................................. කි.
35. රස භාව නිරූපණය කිරීමේ දී පාත්‍රයාගේ සිත් තුළ ඇති භාවයන් බාහිරව ප්‍රකාශ කිරීම .................................................. ලෙස හැඳින්විය හැකිය.

- **36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉරමත ලියන්න.**

36. දේශීය නර්තන ඉතිහාසයේ කාන්තා නර්තනයට පුරෝගාමී මෙහෙවරක් ඉටුකළ දෙදෙනෙක් නම් කරන්න.
    1. ..................................................................................................
    2. ..................................................................................................

37. තුන් සුළු දෙමහ පස් තිතට නර්තනය කළ හැකි උඩරට හා සබරගමු නර්තන අංග දෙක නම් කරන්න.
    1. උඩරට ..................................................................................................
    2. සබරගමු ..................................................................................................

38. අංග රචනය හා බැඳි මූලික අංග දෙකක් නම් කරන්න.
    1. ..................................................................................................
    2. ..................................................................................................

39. නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන චරිත නිරූපණවලදී චරිතයේ ගති ස්වභාවය ඉස්මතු කිරීමට භාවිත චලන වර්ග දෙක නම් කරන්න.
    1. ..................................................................................................
    2. ..................................................................................................

40. පතුරු නැටුම හා මෝල්ගස් නැටුම ගැමි නැටුම් ලෙස ප්‍රථම වරට වේදිකාවට ඉදිරිපත් කිරීම සඳහා දායක වූවන් නම් කරන්න.

1. පතුරු නැටුම ..........................................................................................................

2. මෝල්ගස් නැටුම ..........................................................................................................

41. සිරිවසගෙන අසු නැගෙමින් නොලෙසා ..... මෙහි සැදැස්මත් හා ගීමත් ගණන ලියන්න.

1. සදැස්මත් ..........................................................................................................

2. ගීමත් ..........................................................................................................

42. මෙම රූප සටහනෙහි දැක්වෙන රංග උපකරණය හා ඊට අදාළ නාට්‍යමය පෙළපාලිය අන්තර්ගත ශාන්ති කර්මය නම් කරන්න.



1. රංග උපකරණය :- ..................................................

2. ශාන්ති කර්මය :- ..................................................

43. කාවඩි නර්තනයේ දී භාවිතා කරන මෙවලම් සංකේතවත් කරන කඳු දෙක නම් කරන්න.

1. ..........................................................................................................

2. ..........................................................................................................

44. ආලෝක වර්ණ භාවිතයේ දී රතු + කොළ සහ රතු + නිල් වලින් සැදෙන ද්විතික වර්ණ දෙක නම් කරන්න.

1. රතු + කොළ ..........................................................................................................

2. රතු + නිල් ..........................................................................................................


45. තිල්ලානා තරානා යන නර්තන අංග අයත් සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

1. තිල්ලානා - ..........................................................................................................

2. තරානා - ..........................................................................................................

46.

**A**



**B**




A හා B රූප සටහන් වලින් දැක්වෙන වාද්‍ය භාණ්ඩ දෙක නම් කරන්න.

1. A - ..........................................................................................................

2. A - ..........................................................................................................

47.

ඉහත රූප සටහන් තුළින් බැලේ හා කථක් නර්තන සම්ප්‍රදායන්ට අයත් වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

1. බැලේ - ..........................................................................................................................................

2. කථක් - ..........................................................................................................................................

48. ''සුද්ධ ලෙසට ලෙලවා දළුමුර සතකී....'' මෙම කවි පදය අයත් වන ශාන්ති කර්මය හා නාට්‍යමය පෙළපාළිය නම් කරන්න.

1. ශාන්ති කර්මය - ..........................................................................................................

2. නාට්‍යමය පෙළපාළිය - ..........................................................................................................

49. රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වූ වර්ෂය හා කැළණි විශ්ව විද්‍යාලයට සෞන්දර්ය අධ්‍යයන ආයතනය අනුබද්ධ කළ වර්ෂය සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

50. මනිපුරි නර්තන සම්ප්‍රදායේ ආගමික හා සාමාජීය සබඳතා පිළිබිඹු කරමින් පවත්නා උත්සවය හා එහිදී නිරූපණය කරන දේව චරිතය නම් කරන්න.

1. උත්සවය - ..........................................................................................................

2. දේව චරිතය - ..........................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
Third Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# නර්තනය (දේශීය) II

කාලය පැය තුනයි

- **පළමුවන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්ය වේ.**
- **II හා III යන කොටස් වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක් ද (ii) කොටසට ලකුණු 06 ක් ද (iii) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමිවේ.**

## I කොටස

01. i. ගජගා වන්නමට අයත් බෙර පදය සහ කවි පදයක් ප්‍රස්තාර කරන්න.
    ii. පහත සඳහන් කවි පද දෙක අදාල තිත් රූපයට අනුව ප්‍රස්තාර කරන්න.
    ''ඇත සිට පෙරුමන් පුරාගෙන
    මෙතේ මුනිබුදු බව පතාගෙන''
    iii. සිව් තිතේ තාල රූපයට අයත් වට්ටමක අඩව්වක් ප්‍රස්තාර කරන්න.

02. ඉතිහාසගත තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ නර්තන කලාව පැවති බවට විවිධ සාධක හමුවේ.
    i. ප්‍රාග් බෞද්ධ යුගයේ විවිධ ආගමික හා රාජ්‍ය උත්සව අවස්ථාවන් හි දී නැටුම්, ගැයුම්, වැයුම් පැවැත් වූ බවට සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
    ii. ගම්පල යුගයේ භාරතීය ආභාෂය ලැබුණු බවට පුරා විද්‍යාත්මක හා ලිඛිත මූලාශ්‍ර ඇසුරෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.
    iii. නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි ජන මාධ්‍ය හා අන්තර්ජාතික සංස්කෘතික ලක්ෂණ බලපෑ ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

## II කොටස

03. සිංහල ශාන්තිකර්ම විවිධ අනන්‍යතා ලක්ෂණ වලින් සමන්විතය.
    i. කිරිමඩුව ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.
    ii. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ඌරා යක්කම රඟ දැක්වීමේ දී චරිත නිරූපණ කාර්යය සඳහා භාවිත විධික්‍රම විස්තර කරන්න.
    iii. සන්නි යකුමේ එන සන්නි හා පාලි රංගනවල රංග වස්ත්‍රාභරණ පිළිබඳ ඇගයීමක් කරන්න.

04. ශාන්ති කර්ම පුරාවෘත්ත කථා මගින් සමාජ සංසිද්ධි විවරණයකරන අතර විවිධ සැරසිලි හා රංග වස්ත්‍රාභරණ තුලින් එහි විචිත්‍රත්වය මැනවින් පිළිබිඹු කරයි.

i. ශාන්ති කර්මයක පුරාවෘත්ත කථාවක් ඇසුරෙන් හෙළිවන සමාජ සාරධර්ම පිළිබඳව විමසීමක් කරන්න.

ii. බලි ශාන්ති කර්ම ගායනාවල සුවිශේෂතා දැකිය හැකිය පිරික්සන්න.

iii. රටයකුම ශාන්ති කර්මයේ සැරසිලි හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.

05. ගැමි නැටුම් හා ගැමි ගායනා වලින් හෙළිවන්නේ ඔවුන්ගේ ජීවන රටාවේ අව්‍යාජත්වයයි.

i. ගැමි ගායනා උදාහරණයට ගෙන ඉහත පාඨය පැහැදිලි කරන්න.

ii. අද්‍යතනයේ ප්‍රාසාංගිකත්වයෙන් යුතුව නිර්මාණය කළ ගැමි නැටුම් දෙකක් හා එයට පුරෝගාමී වූවන් නම් කර ඉන් එක් ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

iii. වෘත්තීන් පදනම් කරගෙන සිංහල මෙන්ම ද්‍රවිඩ ගැමි නැටුම් නිර්මාණය වී ඇත.
නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි (A), (B), (C) යන කොටස්වලට අදාලව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
| ශබ්දම් | පියානෝව | හංසවිල |
| වර්ණම් | සාරංගිය | කරදිය |
| තරානා | නටුවාංගම් | නල දමයන්ති |
| ඨුම්රි | මෘදංගය | බැරිසිල් |

i. "A" කොටසින් භරත නර්තන සම්ප්‍රදායට අදාල නර්තන අංග දෙකක් තෝරා ඒ පිළිබඳ විස්තර කරන්න.

ii. "B" කොටසේ සඳහන්වන තත් වාද්‍ය භාණ්ඩයට අදාල සංගීත සම්ප්‍රදාය පිළිබඳ විස්තරයක් කරන්න.

iii. "C" කොටසෙහි සඳහන් බැලේ නිර්මාණය නම් කර එම කලා කෘතිය ඇතුලත් සම්ප්‍රදායේ ප්‍රභවය හා විකාශය පිළිබඳ විමසීමක් කරන්න.

07. පෙරදිග හා අපරදිග ආභාෂය තුළින් අද්‍යතන නර්තන කලා අංග නිර්මාණය වී ඇත.

i. නර්තන සංචලන කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

ii. අද්‍යතන සමාජ අවශ්‍යතා හා රුචිකත්ව නර්තන කලාව කෙරෙහි විවිධ අයුරින් බලපා ඇත. විමසන්න.

iii. ගෝලීයකරණය හා සබැඳි තාක්ෂණික මෙවලම් හා ක්‍රම ශිල්ප භාවිතය අද්‍යතන නර්තන කලාවේ ප්‍රගමනයට හේතු වූ ආකාරය විස්තර කරන්න.

08. අද්‍යතන ප්‍රාසාංගික නර්තන නිර්මාණකරණයේ දි ආනුෂාංගික කලා භාවිතය වැඩි වශයෙන් දැකිය හැකිය.

i. නව ප්‍රවණතාවලට අනුව රංග වස්ත්‍රාභරණ නිර්මාණකරයේ දී යොදා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විමසීමක් කරන්න.

ii. චිත්‍ර කලාවේ මූලික අංග නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

iii. අද්‍යතන නව නර්තන නිර්මාණ දෙස් විදෙස් සංගීත ශෛලියෙන් මිශ්‍ර වී ඇත. ශ්‍රී ලාංකීය මුද්‍රා නාට්‍ය සහ චිත්‍රපට කලාව ඇසුරින් විස්තර කරන්න.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2019**

**13 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය**

**I කොටස**

1. 2 6. 4 11. 3 16. 1 21. 4
2. 1 7. 1 12. 3 17. 5 22. 5
3. 1 8. 4 13. 1 18. 5 23. 1
4. 5 9. 2 14. 5 19. 2 24. 3
5. 4 10. 3 15. 3 20. 3 25. 5

26. නානුමුර පෙට්ටිය හෙවත් උනු නුපියන
27. පැරකුම්බා සිරිත
28. මලය රජ තුන් කට්ටුව (කිත්සිරි, සඳලිදු, මලය)
29. සිරිකත වන්නම
30. තෙල්ලි කොත්තුවා
31. වර්ණම්
32. කඩිප්පු
33. සෝම බන්දු විද්‍යාපති
34. එක් වියත් තුනගුලකි.
35. ආනුභාව
36. 1. චන්ද්‍රලේඛා මහත්මිය 2. මේරියන් පීරිස් මහත්මිය
37. 1. මංගලම් 2. මුල් මාත්‍රය
38. 1. වර්ණ හැඩතල 2. රේඛා අමුද්‍රවය
39. 1. ස්ථිතික 2. සංචාරී
40. 1. පියසාර ශිල්පාධිපති 2. මිරැන්ඩා හේමලතා
41. 1. සදැස්මත් - 16 2. ගීමත් - 24
42. 1. කපු ගස 2. රට යකුම
43. 1. ශිව ගිරි 2. සප්ත ගිරි
44. 1. කහ (Yellow) 2. රතුවන් දම් (Majenta)
45. 1. භරත 2. කථක්
46. 1. A - මෘදංගය 2. B - සාරංගිය
47. 1. පියානෝව - බැලේ 2. පක්වාජය - කථක්
48. 1. ශාන්ති කර්මය - පහන් මඩුව 2. නාට්‍යමය පෙළපාලිය - පොත් කඩේ යක්කම
49. 1. 1972 2. 1974
50. 1. උත්සවය - හෝලි 2. දේව චරිතය - ක්‍රිෂ්ණ

**(ප්‍රශ්න අංක 01 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 යි.)**

## II පත්‍රය - I කොටස

01. i.

| 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | කුං | ජිං | - | ජිං | - | ත | ක | ජිං | - | ත | ක | ජිං | - | කු | දි |
| + | + | + | + | + | + | දෙ | වි | පු | - | - | - | ර | - | - | - |
| ඇ | - | - | - | තෙ | - | - | - | කී | - | - | - | - | - | - | - |
| - | - | - | - | + | + | කු | ඹු | දි | - | - | - | හ | - | - | - |
| ස | - | - | - | ය | - | - | - | කී | - | - | - | - | - | - | - |

ගුරු අත් පොතට අනුව ප්‍රස්තාර කිරීම. සංකේත භාවිතයට ලකුණු - 02
බෙර පදය නිවැරදිව ප්‍රස්ථාර කිරීම ලකුණු - 02
කවි පද ප්‍රස්තාර කිරීම - 02
මුළු ලකුණු - 06

ii.Type equation here.

| 1̂ | 2 | 3 | 1́ | 2 | 3 | 4 | 1̂ | 2 | 3 | 1́ | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ඇ | ත | සි | ට | පෙ | රු | මන් | - | පු | ගු | - | ගෙ | න |
| + | මෙ | තේ | මු | නි | බු | දු | බ | ව | ට | තා | - | ගෙ | න |

සංකේත භාවිතයට ලකුණු - 02
කවි පද ප්‍රස්ථාරයට ලකුණු - 04
මුළු ලකුණු - 06

iii.

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජෝ | ජිං | ත | කු | ත | ත | ජි | ජි | කු | දි |
| ගත් | – | ජිත් | – | තත් | – | කුං | - | දිං | – |
| ත | ත | ජිත් | – | තත් | – | කුං | – | දිං | – |
| ග | ජිං | – | ත | ග | ජි | ත | කු | දිං | – |
| ජි | ජිං | – | ත | ජි | ජි | ත | කු | දිං | – |
| තක් | කඩ | ජික් | කඩ | දොං | කඩ | තරි | කිට | ජිත් | – |
| තරි | කිට | ජිත් | කඩ | දොං | කඩ | තරි | කිට | ජිත් | – |
| දොදි | දොං | තරි | කිට | දොං | කඩ | තරි | කිට | කු | දි |
| ගජි | – | ජි | ජි | ග | ත | කු | දි | ග | ත |
| ග | ත | දොදි | – | දොං | – | දො | දොං | – | ත |
| දොං | කඩ | තරි | කිට | ජිත් | – | තා | – | – | – |
| ගත් | – | ත | කු | ජිත් | – | තා | – | – | – |
| ග | ජි | ත | කු | ජිත් | – | තා | – | – | – |
| ගජි | – | ජිත් | – | ත | ත | දො | මි | කි | ට |
| දොං | කඩ | තරි | කිට | ජිත් | – | තා | | | |

සංකේත භාවිතයට ලකුණු - 02
අඩව්වක් නිවැරදිව ප්‍රස්තාර කිරීම ලකුණු - 06
මුළු ලකුණු - 08

02. i. **පුරා විද්‍යාත්මක**

* ඇම්බැක්කේ දේවාලයේ දක්නට ලැබෙන නළඟන රූපය තුළින් එකල නර්තන ක්ෂේත්‍රය තුළ භාරතීය ආභාෂය තිබූ බව පැහැදිලි වීම. ගඩලාදෙණි විහාර පාදමේ රූකම් තුළින් ද භාරතීය ආභාෂය ලබා ඇති බව ලියා ඇත්නම්

**ලිඛිත (තිසර සංදේශයේ)**

* ''තලහම් කලබෙර තම්මැටපට තන්තිරි ඩමරු'' යන කවියෙහි අන්තර්ගත වාද්‍ය භාණ්ඩ දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයට වඩාත් සමීප බව දක්වා ඇත්නම්
* ඉබන් බතුතාගේ සංචාරක වාර්තාව දෙවුන්දර උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් පන්සියයක් පමණ නර්තනයේ යෙදුණු බව, එය දකුණු ඉන්දීය දේවදාසි නර්තනයේ ආභාෂය ලබා ඇති බව දක්වා තිබීම. ආදී කරුණු වලින් පිළිතුර ලියා තිබීම. (ල. 06)

ii. **මහා වංශය**

* පණ්ඩුකාභය රජතුමා හා සම්බන්ධ උත්සව පිළිබඳ දක්වන තැන.... ''ඒ පණ්ඩුකාභය රජ තෙමේ චිත්තරාජ නම් යක්ෂයා සමග සම අසුන්හි හිඳ දෙව් මිනිස් නැටුම් කරවමින්.....'' සටහන් කර ඇති බව දක්වා තිබීම.
  ආදී කරුණු වලින් පිළිතුර ලියා තිබීම.

**දීප වංශය**

* ශ්‍රී මහා බෝධිය සිරිලකට වැඩම කරවන අවස්ථාවේ මහා බෝධිය සහිත පෙරහැර විවිධ නර්තන හා වාදන සහිතව පැවති බව දක්වා තිබීම. (ල. 06)

iii. **ජන මාධ්‍ය ප්‍රචනතා**

* ශාන්ති කර්ම, නර්තන වැඩසටහන්, ප්‍රවීණ නර්තන ශිල්පීන් සහභාගිවන සාකච්ඡා මණ්ඩප වාර්තා වැඩසටහන් රූපවාහිනිය මඟින් විකාශය වීම.
* සියලු වයස් කාණ්ඩවලට අදාල නර්තන තරඟ පැවැත්වීම.
* තරඟ විනිශ්චය මණ්ඩලවලට අමතරව එස්.එම්.එස්. මනාප මඟින් ප්‍රේක්ෂකයින් සහභාගි කරවා ගැනීම.
* විවිධ ජාතීන්ට අයත් නර්තන අංග ඇතුලත් වැඩසටහන් විකාශය කිරීම.
* වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා නර්තනය යොදා ගැනීම. (ල. 04)

**අන්තර්ජාතික සංස්කෘතික සබඳතා**

* අන්තර්ජාලය මඟින් ලෝකයේ ඕනෑම රටක, ඕනෑම ස්ථානයක ඇති නර්තන අංග නැරඹීමේ හැකියාව.
* තම නිර්මාණ අන්තර්ජාලයට මුදා හැරීමට ඇති හැකියාව.
* සංචාරක ව්‍යාපාරය ආදී ක්ෂේත්‍රයන් සඳහා නර්තනය යොදා ගැනීම.... ආදිය විස්තර කර ඇත්නම්. (ල. 04)

12
08
මුළු ලකුණු - 20

03. i. කිරිමඩුව පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර ඇත්නම්. (ල. 06)

ii. * හාස්‍ය රසය ඉස්මතුවන දෙබස් හා ව්‍යාජ තොරතුරු ඇතුලත් දෙබස් යොදා ගැනීම පිළිබඳව ලියා තිබීම. (උදාහරණ සහිතව)
* ඌරාගේ දඩුරුවක් ගෙන යක්දෙස්සා අතෝරකරු සමඟ අණුකරනාත්මක රංගනයක යෙදීම.
* ඒ සඳහා කවි ගායනා යොදා ගැනීම.
* ඌරා කොටස් කරන ගමන් උපහාසාත්මක ලෙස කවි දෙබස් යොදා ගනිමින් රංගනයේ යෙදීම. ආදී උදාහරණ සහිතව පිළිතුර ලියා තිබීම. (ල. 06)

iii. * සන්නි හා පාලි රංගනවල භාවිතා කරන රංග වස්ත්‍රාභරණ නම් කර තිබීම.
* යොදාගන ඇති අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කර ඇත්නම්.
* වෙස් මුහුණු විවිධ කා නා වර්ණ භාවිතය පිළිබඳ ලියා තිබීම.
* රංග වස්ත්‍රාභාරණවල වර්ණ භාවිතය හා අලංකරණවල සුවිශේෂ ලක්ෂණ දක්වා තිබීම.
යනාදී කරුණු හා අදාල වෙනත් කරුණු ද ඇතුලත් කර පිළිතුර ලියා තිබීම. (ල. 08)
(මුළු ලකුණු 20)

## II කොටස

04. i. සන්නියකුම, වළියක් මංගල්‍ය, රටයකුම ආදී ශාන්ති කර්ම වලින් එක් ශාන්ති කර්මයක පුරාවෘත්ත කථාවක් ගෙන ඒ තුළින් හෙළිවන සාරධර්ම පිළිබඳව ලියා ඇත්නම් (ල. 06)

ii. ග්‍රහ පංති කවි, කඩතුරා කවි, බලිමඩුපුරය ඇඹුම් කවි , හිං හතරේ කවි, සිරස පාද කවි
* කවි ගායනාවල බුදු ගුණ අන්තර්ගත බව.
උදා :- පිරිත් හූය කවි, සිරස පාද කවි
* විවිධ තාල හා නාදමාල කවි ගායනාවල අන්තර්ගත වී ඇති බව.
* අත්මිණිය හා දැල් වූ පන්දමක් හෝ පුවක් මල් කිනිත්තක් දෑතට ගන්නා බව.
* ප්‍රාදේශීය වශයෙන් යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ භාවිතා කරන බව.
* සුවිශේෂී බලි ගායනා මගින් ආතුර මනස සුවපත් වන බව.... ආදී ලෙස දක්වා තිබීම. (ල. 06)

iii. * නානුමුරය, කපුයක්කාරිය, දරු නැලවිල්ල වැනි අවස්ථාවලදී සැරසිලි ක්‍රම යොදාගන්නා ආකාරය.
* කපමුයක්කාරියේ දී පරිහරණය කරනු ලබන පේෂකර්ම හා
* රංග වස්ත්‍රාභරණ, මල් මඩුව (රිද්ද යාග මණ්ඩපය, රටයකුම් වීදිය)
* පිදේනි, මල් යහන්, කන්තිරික්ක ආදී
* නානුමුරයේ භාවිතයට ගන්නා උපකරණ
* කපුයක්කාරියේ දී පරිහරණය කරනු ලබන පේෂකර්ම හා සම්බන්ධ කපුගස, යන්ත්‍රය , වවුන්න ..... ආදී
* රට යකුම ශාන්ති කර්මයේ විවිධ නර්තන අංග අවස්ථා සඳහා භාවිතා කරනු ලබන රංග වස්ත්‍රාභරණ ආදී කරුණු තුලින් පිළිතුර ලියා තිබීම. (ල. 08)
(මුළු ලකුණු 20)

05. i. * කවි ගායනා ඉදිරිපත් කරමින්
සාමුහිකත්වය, සමඟිය හා සහජීවනය, සරල බව වැඩිහිටියන්ට ගරු කිරීම, දෙගුරුන්ට ගරු කිරීම සම්බන්ධව හා
* ආගමික විශ්වාස
* හිරු සඳු වැනි ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් පිදීම යනාදි කරුණු ඇතුලත් කවි ගායනා ආදිය ඇතුලත් කර පිළිතුර ලියා තිබීම. (ල. 06)

ii. * පතුරු නැටුම - පියසාර ශිල්පාධිපති මයා
* මෝල්ගස් නැටුම - මිරැන්ඩා හේමලතා මිය
* ගොයම් නැටුම - පණීභාරත මයා
ගැමි නැටුම් හා අදාල ශිල්පීන් නම් කිරීමට (ල. 02)
එක් ගැමි නැටුමක් විස්තර කිරීමට (ල. 04)

iii. * වෘත්තීන් ඇසුරින් නිර්මාණය වී ඇති ගැමි නැටුම් පිළිබඳව විස්තර කර තිබීම.
* සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල එන වෘත්තීන් ඇසුරින් නිර්මාණය වූ නැටුම් අංග නම් කිරීම.
* කුළු නැටුම - සුළකු * තේ දළු නැටුම - කොළන්දු පරිතාල්
* ගොයම් නැටුම - අරියවෙට්ටු
ඉහත සඳහන් නර්තන අංග හෝ වෙනත් වෘත්තීන් හා සම්බන්ධ ගැමි නැටුම් කවි ගායනා තුලින් විස්තර කිරීමට (ල. 08)
(මුළු ලකුණු 20)

06. i. ශබ්දම් හා වර්ණම් තෝරා නම් කර ඇත්නම් (ල. 01)
හා විස්තර කිරීමට (ල. 05) (ල. 06)

ii. * තත් වාද්‍ය භාණ්ඩය හා ඊට අදාල සංගීත සම්ප්‍රදාය නම් කිරීමට. (ල. 02)
* සංගීත සම්ප්‍රදාය විස්තර කර තිබීම. (ල. 04) (ල. 06)

iii. * C කොටසෙහි ඇතුලත් බැලේ නිර්මාණය හංසවිල බව දක්වා තිබීම.
* බැලේ නර්තන සම්ප්‍රදාය ප්‍රභවය හා විකාශය පිළිබඳව විස්තර කර තිබීම. (ල. 08)
(මුළු ලකුණු 20)

07. i. * ඉන්දියානු චිත්‍රපට නර්තන අංග,
* භාරතීය ශාස්ත්‍රීය නර්තන අංග,
* බටහිර බැලේ හා සමාජ නර්තන අංග,
* පෙරදිග අපරදිග සංචලන, රංග වස්ත්‍රාභරණ හා සංගීතය ආදිය තුළින් ලියා ඇත්නම්. (ල. 06)
ii. * විනෝදාස්වාදය, වාණිජත්වයට නැඹුරුවීම, අධ්‍යාපනික අවශ්‍යතා .... යනාදී කරුණු අයදතන නර්තන කලාව කෙරෙහි බලපා ඇති බව උදාහරණ දක්වමින් විමසා ලියා තිබීම. (ල. 06)
iii. * අන්තර්ජාලය හරහා දැනුම ලබා ගැනීම.
* ආලෝකකරණ ශිල්ප ක්‍රම.
* ඩිජිටල් තාක්ෂණ ක්‍රම යොදා ගැනීම.
* රංග භූමිවල විවිධතා.
* ඒ පිළිබඳව විස්තර කර තිබීම.
* විද්‍යුත් තාක්‍ෂණික ක්‍රම යොදා ගැනීම.... ආදී කරුණු ඔස්සේ පිළිතුර ලියා ඇත්නම් (ල. 08)
(ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20)

08. i. දේශීය රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී භාවිත අමුද්‍රව්‍ය, රෙදි, ලෝහ, දැව කොටස්, රබර්, ප්ලාස්ටික්, වීදුරු, පබළු ආදී කරුණු ඔස්සේ පිළිතුර විස්තර කර ලියා ඇත්නම් (ල. 06)
ii. * චිත්‍ර කලාවේ මූලිකාංග වන ඇඳීම, ඇඹීම, කැටයම් කැපීම, වර්ණ ගැන්වීම, නෙළීම, රේඛා , හැඩ හා හැඩතල මෝස්තර, අවකාශය හා ආකෘතිය ඔස්සේ විවිධ මාධ්‍ය හා ශිල්ප ක්‍රම භාවිතය නර්තන කලාව හා සම්බන්ධවන ආකාරය උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් (ල. 06)
iii. කරදිය, නල දමයන්ති, මුදු නාට්‍යය හා කුස පබා, පත්තිනි, යශෝධරා වැනි ශ්‍රී ලාංකික චිත්‍රපට තුළින් ඉහත නියමන සනාථ කර ඇත්නම් (ල. 08)
(ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20)